දුම්රිය
புகையிரத
Railway — GMF 35

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு)
Telephone
*E- mail*: gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office — 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax — 2446490


# ශ්‍රී ලංකා දුම්රිය සේවය
## இலங்கை புகையிரத சேவை
## SRI LANKA RAILWAYS


මගේ අංකය
எனது இல
My No. — GMR/Media/28/09/2026

සාමාන්‍යාධිකාරී
තැ.පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர்
அலுவலகம்
த. பெ. 355இ ஒல்கொட்
மாவத்தை
கொழும்பு 10

General Manager's Office,
P.O. Box 355, Olcott Mawatha,
Colombo 10.


දිනය
தேதி
Date — 2026/09/28

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

**<u>"දිට්වා" සුළි කුණාටු තත්ත්වයෙන් පසු උඩරට මාර්ගයේ පේරාදෙණිය/ ගම්පොල දක්වා දුම්රිය ධාවනය ආරම්භ කිරීම.</u>**

"දිට්වා" සුළි කුණාටු තත්ත්වය නිසා රඹුක්කන - ගම්පොල අතර දුම්රිය මාර්ගය ස්ථාන 103 ක් හානියට ලක්ව තිබුණි. ඉන් විශාල ප්‍රමාණයේ නාය යෑම් 36 ක් සිදුවී තිබුණි. මීට අමතරව දුම්රිය මාර්ගය සේදී යාම්,පස්කඳු කඩා වැටීම් 67 ක් සිදුවී තිබුණි. රඹුක්කන / කඩුගන්නාව දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග පද්ධතියේ වැඩිම ආනතිය (gradient) ඇති මාර්ග කොටස් වලින් එකක් වීම, එම ප්‍රදේශයට ළඟාවීම සඳහා විකල්ප සැපයුම් මාර්ග නොමැතිවීම, අයහපත් කාලගුණික තත්ත්වය හා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය දුම්රිය මගින්ම ප්‍රවාහනය කිරීමට සිදුවීම යන අභියෝග මධ්‍යයේ සියළු ප්‍රතිසංස්කරණ කටයුතු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමග එක්ව දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුව විසින් සිදුකර මාර්ගය ධාවනයට සුදුසු තත්ත්වයට මේ වනවිට පත්කර ඇත.

කොළඹ කොටුව - පේරාදෙණිය / ගම්පොල අතර සාමාන්‍ය දුම්රිය කාල සටහන 2026/10/02 දින සවස් වරුවේ ආරම්භ කරන අතර එතැන් සිට පහත දුම්රිය ධාවන කාල සටහන ක්‍රියාත්මක වේ.

| **නගරාන්තර දුම්රිය** | | | |
|---|---|---|---|
| **අංක 1029 - 2026/10/02 දින සිට - දිනපතා** | | **අංක 1030 - 2026/10/03 දින සිට - දිනපතා** | |
| කොළඹ කොටුව පිටත්වීම | ප.ව.03.35 | පේරාදෙණිය පිටත්වීම | පෙ.ව.06.25 |
| පේරාදෙණිය ළඟාවීම | ප.ව.05.56 | කොළඹ කොටුව ළඟාවීම | පෙ.ව.08.44 |

| **දුම්රිය අංක 1035 - 2026/10/02 දින සිට - දිනපතා** | | **දුම්රිය අංක 1040 - 2026/10/03 දින සිට - දිනපතා** | |
|---|---|---|---|
| කොළඹ කොටුව පිටත්වීම | ප.ව.04.35 | ගම්පොල පිටත්වීම | පෙ.ව.04.35 |
| මරදාන | ප.ව.04.40 | පේරාදෙණිය | පෙ.ව.04.56 |
| අලව්ව | ප.ව.05.46 | රඹුක්කන | පෙ.ව.06.21 |
| පොල්ගහවෙල | ප.ව.05.56 | පොල්ගහවෙල | පෙ.ව.06.34 |
| රඹුක්කන | ප.ව.06.10 | අලව්ව | පෙ.ව.06.45 |
| පේරාදෙණිය | ප.ව.07.17 | මරදාන | පෙ.ව.07.59 |
| ගම්පොල ළඟාවීම | ප.ව.07.51 | කොළඹ කොටුව ළඟාවීම | පෙ.ව.08.06 |

| **දුම්රිය අංක 1037 - 2026/10/02 දින සිට - දිනපතා** | | **දුම්රිය අංක 1038 - 2026/10/03 දින සිට - දිනපතා** | |
|---|---|---|---|
| කොළඹ කොටුව පිටත්වීම | ප.ව.05.15 | පේරාදෙණිය | පෙ.ව.04.40 |
| මරදාන | ප.ව.05.20 | රඹුක්කන | පෙ.ව.05.43 |
| රඹුක්කන | ප.ව.06.48 | මරදාන | පෙ.ව.07.06 |
| පේරාදෙණිය | ප.ව.07.53 | කොළඹ කොටුව ළඟාවීම | පෙ.ව.07.12 |

| **පොඩි මැණිකේ දුම්රිය (අංක 1005/1006) - 2026/10/03 දින සිට - දිනපතා** | | | |
|---|---|---|---|
| කොළඹ කොටුව පිටත්වීම | පෙ.ව.05.55 | ගම්පොල පිටත්වීම | ප.ව.04.10 |
| පේරාදෙණිය | පෙ.ව.08.34 | පේරාදෙණිය | ප.ව.04.31 |
| ගම්පොල ළඟාවීම | පෙ.ව.09.06 | කොළඹ කොටුව ළඟාවීම | ප.ව.07.23 |

ඉහත දුම්රිය ධාවනය සම්බන්ධව ජනමාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

G.D.A සමරසිංහ.
අධිකාරී (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට